Article 11
Article 13 (1).

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019-03-22 |

පැමිණිලිකරු : ඩබ්.ජේ. ඇන්ටනි මයා.
10/1. පරණ රේල් පාර.
ගරාගොඩ. යටියන්තොට.

වගඋත්තරකරුවන් :

1. පො.කො 12222 වසන්ත මයා.
පොලිස් ස්ථානය.
යටියන්තොට.

2. පො.කො 46120 චන්දන මයා.
පොලිස් ස්ථානය.
යටියන්තොට.

3. ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
යටියන්තොට.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/398/15 හා HRC/1149/15</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015.02.02 වන දින නිවසේ සිටියදී පො.ප ප්‍රියන්ත නිලධාරියා පැමිණ පොලිස් ජීප් රථයෙන් තමා යටියන්තොට පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්. ඉන් පසුව තමාට උපසේවයේ පිටුපස හිඳ ගන්න කියා කියූ බවත් පො.සැ 12222 වසන්ත සහ 46120 චන්දන යන නිලධාරීන් දෙදෙනා උපසේවයට පැමිණ තමාට පහරදී බිම දමා පිස්තෝලය කටට දැමූ බවත් තමා එවිට කෑ ගැසූ බවත් ඒ අවස්ථාවේදී තමාගේ බිරිඳ එම ස්ථානයට පැමිණි බවත්ය. ඉන් පසුව තමා එම ස්ථානයෙන් රථ වාහන අංශයට ගෙන ගොස් එහිදීද පහරදුන් බවත් ඉන් පසුව පො.ප ප්‍රියන්ත මහතා පැමිණ තමා කූඩුවට රැගෙන ගිය බවද එම අවස්ථාවේදී තම බිරිඳ සහ නැන්දම්මා එම ස්ථානයේ සිටි බවත් සඳහන් කර ඇත. ඉන් පැයකට පමණ පසුව තමා කරවනැල්ල මූලික රෝහලට රැගෙන ගිය බවත් පො.කො 48700 තිලකරත්න මහතා භාරයේ තමා රෝහලට ඇතුළත්


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කළ බවද සඳහන් කර ඇත. අනතුරුව පො.සැ 47702 ජීවානන්ද මහතා තමාගෙන් ප්‍රකාශ ලබාගෙන ඇපකරුවෙකු ලෙස තමාගේ බිරිඳට අත්සන් කරන ලෙසට පැවසූ පසු ඇප දීමට කළ වරද කුමක්දැයි විමසා සිටීමේදී කසිප්පු වලට නඩු දමා ඇති බවට දන්වන ලද බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ, තමා පැමිණිල්ලකට අත්අඩංගුවට ගත් බව සඳහන් කළද තමාට නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවත් අත්අඩංගුවේදී තමාට පහරදීම හේතුවෙන් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් එබැවින් තමාට වන්දි මුදලක් ලබා ගැනීමට මෙම පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි පො.කො 46120 චන්දන ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ඉහත චෝදනා පිළිනොගන්නා බවත් 2015.02.02 වන දින උදෑසන 10.00 ට පමණ උ.පො.ප මහින්ද මහතාට ලද ආරංචියකට අනුව යටියන්තොට දෙගල්අස්ස ප්‍රදේශයේ වැටලීම් රාජකාරියකට තවත් නිලධාරීන් පිරිසක් සමඟ පිටව ගොස් පැය 10.25 ට පමණ දෙගල්අස්ස නැමැති වතුයායේ කැලෑ ප්‍රදේශයක බෑවුම් සහිත ස්ථානයක ගෝඩා බැරල් දෙකක් සන්තකයේ තබාගෙන සිටියදී ජේසුදාසන් ඇන්ටන් යන පුද්ගලයා හඳුනාගත් බවත්, එසේ හඳුනාගෙන නිලධාරීන් කණ්ඩායම ඔහු අත්අඩංගුවට ගැනීමට එම ස්ථානයට ලඟා වෙත්ම සැකකරු ගෝඩා බැරල් දමා පැනයාමට තැත් කරන ලද අවස්ථාවේදී සැකකරු පය පැටලී බිම ඇද වැටුනු බවත්ය.

පසුව නිලධාරීන් කණ්ඩායම සැකකරු ලඟටම ලඟා වූ අවස්ථාවේ නැවතත් සැකකරු නැගිට පැන දුවන්නට උත්සහ කළ බවත්, ඒ අවස්ථාවේදී සැකකරු එම භූමියේ ගල්මුල් සහිත කැලෑ සහිත ස්ථානයේ පය පැටලී නැවතත් බිම වැටුනු බවත්, පසුව එම ස්ථානයේදීම උ.පො.ප මහින්ද මහතා විසින් ගෝඩා බැරල් දෙකක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් චෝදනාව කියා දී සැකකරු හා ගෝඩා අත්අඩංගුවට ගන්නා ලද බවද දක්වා ඇත. අත්අඩංගුවට ගෙන නැවත පොලිස් ස්ථානයට පැමිණෙමින් සිටියදී පැය 10.40 ට පමණ දෙගල්අස්ස වත්ත ප්‍රදේශයේදී ගෝඩා බැරල් එකක් සන්තකයේ තබාගෙන සිටි කරුපයියා කනගලිංගම් යන අයත් අත්අඩංගුවට ගෙන මෙම සැකකරුවන් දෙදෙනා සහ නඩුබඩු රැගෙන උ.පො.ප මහින්ද සහ නිලධාරීන් කණ්ඩායම පොලිස් ස්ථානයට පැමිණි බවයි. ඉන් පසු ජේසුදාසන් ඇන්ටන් යන සැකකරු ශබ්ද නගා "මාව මරනෝ, මට ගහනෝ, මගේ ඔළුව රිදෙනවා, බෙල්ල රිදෙනවා මට රෝහල් ගත වෙන්න ඕන, අනුංගේ ගෝඩා වලට මුත් මට නඩු දානවා. මම මේ ගැන මානව හමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කරනවා" යැයි පවසමින් කෑ ගැසූ බවත් පසුව සැකකරුවෙකුට අසනීප තත්වයක් ඇති වුවහොත් වහාම පොලිස් නිලධාරීන් එම සැකකරු වෛද්‍යවරයාට ඉදිරිපත් කිරීමට බැඳී සිටින හෙයින් පොත්පත් වල ලියා සැකකරුවන් ඉදිරිපත් කිරීමේ කාර්යය පසෙක තබා පොලිස් ස්ථානයේ ජීප් රථයෙන් සැකකරු කරවනැල්ල රෝහලට රැගෙන ගිය බව ප්‍රකාශ කර ඇත. රෝහලේදී සැකකරු භාහිර රෝගී අංශයේ වෛද්‍ය නිලධාරීතුමාට ඉදිරිපත් කළ බවත් එම අවස්ථාවේදී මෙම සැකකරු පොලිස් නිලධාරීන්

පහරදුන් බවත් බෙල්ල රිදෙන බවත් බඩ රිදෙන බවත් වෛද්‍යවරයාට පැමිණිලි කළ බවත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති සාක්ෂි :-**

<u>පී.ඒ.ඩී.කේ ටෙක්ලා තුෂාන්ති</u>

ඉහත අය විසින් ප්‍රකාශ කොට ඇත්තේ. 2015.02.02 වන දින පෙ.ව 9.00 ට පමණ යටියන්තොට පොලිස් ස්ථානයේ පො.ප ප්‍රියන්ත යන අය විසින් පැමිණිලිකරුට විරුද්ධව පැමිණිල්ලක් කර ඇති බව ප්‍රකාශ කොට නිවස අසලදී අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගිය බවත් එම අවස්ථාවේදී සහ තවත් අයකු ත්‍රීරෝධ රථයෙන් ජීප් රථය පිටුපසින් පොලීසිය වෙත ගිය බවත් පොලිස් ස්ථානයේදී චන්දන සහ වසන්ත යන නිලධාරීන් විසින් පැමිණිලිකරුට මාංචු දමා ට්‍රැෆික් බ්‍රාන්ච් එක පැත්තට ගෙන ගොස් පහරදෙනු තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. එසේ පහරදෙන විට ඔහු කෑගැසූ බවත් පසුව පෙ.ප ප්‍රියන්ත යන අය එතනට පැමිණ නැවත මොහු කූඩුවට දැමූ බවත් පසුව එදිනම පොලීසිය විසින් මොහු කරවනැල්ල රෝහල වෙත රැගෙන ගිය බවත් පසුව ඔහු බැලීමට මෙම සාක්ෂිකාරියද කරවනැල්ල රෝහල වෙත ගිය බවත් ප්‍රකාශ කොට ඇත.

<u>ටී.එල්.එන් තිඹිරිපොල</u>

මෙම සාක්ෂිකාරිය පැමිණිලිකරුගේ බිරිඳ වේ. ඇය විසින් දක්වා ඇත්තේ. 2015.02.02 දින පැමිණිලිකරු නිවසේ නිදා සිටියදී අත්අඩංගුවට ගත් බවත් අත්අඩංගුවට ගෙන යටියන්තොට පොලීසිය වෙත රැගෙන ගිය බවත් සාක්ෂිකාරියද ත්‍රීරෝද රථයකින් තවත් අයකු සමඟ ජීප් රථය පිටුපසින් පොලීසිය වෙත ගිය බවත් පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුට පහරදෙනු දුටු බවත්ය. පසුව මෙම පැමිණිලිකරු පොලීසිය විසින් එදින කරවනැල්ල රෝහල වෙත ඇතුළත් කළ බවත් කරවනැල්ල රෝහලේදී පැමිණිලිකැ අමාරුවෙන් කෙඳිරිගාමින් සිටිනු දුටු බවත් ඇප ලබා දීමට අත්සන් කරන ලෙස තමාව පොලිස් නිලධාරියෙකු දැන්වූ බවත්ය. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට හේතු විමසීමේදී ගෝඩා බැරල් දෙකකට නඩු දමා ඇති බව දැනගත් බවත් නමුත් ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ප්‍රකාශ කරන ලද්දේ පැමිණිල්ලක් විභාග කිරීමට සඳහා රැගෙන යන ලද බවට දක්වා ඇත.

**අධිකරණ වෛද්‍ය වාර්තාව :-**

2015.02.02 දින කරවනැල්ල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් මෙම පැමිණිලිකරු රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගනිමින් සිටියදී පරීක්ෂා කොට ඇති අතර. ඊට අදාළ වාර්තාවට අනුව රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසයේ දක්වා ඇත්තේ "පොලිස් නිලධාරීන් විසින් පොලිස් ස්ථානයේදී අතින් පයින් බෙල්ලේ වම් පැත්තට සහ පපුවේ වම් පැත්තට 2015.02.02 දින 10.30 ට පමණ පහරදුන් බව" සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ සිරුරේ සුළු සීරීම් තුවාල දෙකක් හඳුනාගෙන ඇත. එනම්.

01. වම් කණට 3cm ක් පහළින් බෙල්ලේ වම් පැත්තේ පිහිටා ඇති 2cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක්ද,

02. 3cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක් බෙල්ලේ වම් පැත්තේ වම් කණට 5cm පහළින් ඇති බවට හඳුනාගෙන ඇත. වෙනත් බරපතල තුවාල නැත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිලිකරු 2016.02.02 දින යටියන්තොට පොලීසියේ වගඋත්තරකාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී පැමිණිලිකරුට විරුද්ධව පැමිණිල්ලක් තිබෙන බව සඳහන් කොට පසුව ගෝඩා ලඟ තබා ගත් බවට ප්‍රකාශ කර නඩු පවරා ඇති බවට පැමිණිල්ලෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

පොලිස් නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරු කෑලෑවක ගෝඩා බැරල් දෙකක් සන්තකයේ තබාගෙන සිටියදී අත්අඩංගුවට ගත් බවයි.

නමුත් පැමිණිලිකරු කරන ප්‍රකාශය සනාථ කිරීමට සාක්ෂිකාරියන් දෙදෙනකු විසින් ලිඛිතව සාක්ෂි ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පුද්ගලයා නිවසේදී අත්අඩංගුවට ගත් බවයි. ඒ අනුව එම ඇසින් දුටු සාක්ෂි බැහැර කිරීමට හැකියාවක් නොමැත.

එමෙන්ම වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට පහරදුන් බවට කරන ප්‍රකාශය වගඋත්තරකරුවන් ප්‍රතික්ෂේප කරමින් දක්වා ඇත්තේ, එමෙන්ම පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී දිවගොස් බිම වැටුනු බවයි.

පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගොස් පහරදුන් බවයි. පැමිණිල්ල සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කර ඇති සාක්ෂිකාරියන්ද ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුට පොලිස් නිලධාරීන් විසින් පහරදෙනු දුටු බවයි. තවදුරටත් වෛද්‍ය වාර්තාව අනුව බෙල්ලේ සීරීම් තුවාල හඳුනාගැනීම මතද පැමිණිලිකරු වෛද්‍යවරයාට ලබාදෙන ලද කෙටි ඉතිහාසයේ බෙල්ලේ වම් පැත්තට සහ පපුවේ වම් පැත්තට පහරදුන් බවට කරන ප්‍රකාශ තවදුරටත් සනාථ වී ඇත. එනම් වෛද්‍ය වාර්තාව අනුව බෙල්ලේ වම් පැත්තේ සුලු සීරීම් තුවාල 02 ක් හඳුනාගෙන ඇත. එසේම පැමිණිලිකරු දක්වන කරුණු වන පහරදීමේදී බිම වැටුනු බව දක්වන කරුණු සමඟ සිදුවී ඇති සීරීම් තුවාල සැසඳේ.

වගඋත්තරකරුවන් විසින් පහරදීම කළ බවට චෝදනා ප්‍රතික්ෂේප කරමින් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අඩි 10 ක් පහළට පෙරලී වැටීම නිසා තුවාල ඇතිවූ බව සනාථ කිරීමට උත්සහ කළද වැටීම නිසා තුවාල ඇතිවිය හැකි ස්ථාන වන දණහිස, වැලිමිට හෝ අත් පාදවල තුවාල කිසිවක් ඇති වී නොමැත. ඒ අනුව වැටීම නිසා බෙල්ලේ පමණක් තුවාල ඇති වීමට ඇති සම්භාවිතාව අඩුය. ඒ අනුව මෙම සීරීම් තුවාල පහරදීම නිසා ඇති වූ සීරීම් තුවාල බවට නිගමනය කළ හැකිවේ.

එමෙන්ම පැමිණිලිකරු කැලයකදී අත්අඩංගුවට ගත් බවට හා ගෝඩා ලඟ තබාගත් බවට කරන ප්‍රකාශයද සාක්ෂිකරුවන් දෙදෙනා විසින් ලබාදෙන ලද සාක්ෂි මගින් ප්‍රත්‍යක්‍ෂ වනු ඇත. එනම් මෙම අවස්ථාවේ මොහු අත්අඩංගුවට ගන්නා ලද්දේ නිවසේදී නම් කැලෑවකදී ගෝඩා ලඟ තබා ගත්තායැයි වන කාරණය ප්‍රතික්ෂේප වනු ඇත. වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් ක ඇති වාර්තාව අනුව පැමිණිලිකරු නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් මීට පෙර අවස්ථා 5 කදී අත්අඩංගුවට ගෙන අධිකරණය විසින් දඩුවම් ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

නිගමනය :-

මෙම පැමිණිලිකරුට අදාළව සිදුකර ලද විමර්ශනයේදී ඉදිරිපත් කරන ලද සියලු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හේතුව පැහැදිලි නොකිරීම සහ පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ගෝඩා ලඟ තබාගත් බව වගඋත්තරකරුවන් සඳහන් කළද පැමිණිල්ලට පක්ෂව ලබාදන ලද සාක්ෂි අනුව පැමිණිලිකරු නිවසේදී අත්අඩංගුවට ගෙන ඇති බව සනාථ වී ඇත. එමෙන්ම පැමිණිලිකරුට අත්අඩංගුවේදී පහරදී ඇති බව පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන සාක්ෂි අනුව හා වෛද්‍ය වාර්තාව අනුව සනාථ වී ඇත. මේ අනුව වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 13(1) යන ව්‍යවස්ථා මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුට සිදුවූ හානිය වෙනුවෙන්, වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට රු. 5,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2019. 04. 18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

Commissioner

සැ.යු:- අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.